# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1724/21 — 2011 සැප්තැම්බර් 23 වැනි සිකුරාදා - 2011.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 3 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය

ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 3 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 71 වගන්තිය යටතේ ඌව පළාතේ, පළාත් සභාවේ මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන, පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ ආහාර සැපයීම් හා බෙදාහැරීමේ අමාත්‍යතුමා විසින් පනවනු ලැබ 2011.08.11 වැනි දින ඌව පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද රීති.

ආර්. එම්. කුමාරසිරි රත්නායක,
මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන,
පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ
ආහාර සැපයීම් හා බෙදාහැරීමේ අමාත්‍ය,
ඌව පළාතේ පළාත් සභාව.

2011 සැප්තැම්බර් මස 22 වැනි දින,
ආර්. එච්. ගුණවර්ධන මාවත,
බදුල්ල,
අමාත්‍ය කාර්යාලයේ දී ය.

**2011 අංක 3 දරන ඌව පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය**

*රීති*

1. මේ රීතිවලට 2011 ඌව පළාත් සමුපකාර සමිති රීති යැයි කියනු ලැබේ. නාමය

2. සමිතියක් ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කරන සෑම ඉල්ලුම් පත්‍රයක්ම ලියාපදිංචි කිරීම

(i) රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන ආකෘති පත්‍රයක් අනුවම විය යුතු ය.

(ii) සමිතියේ සෑම මුල් සාමාජිකයා විසින්ම අත්සන් කර තිබිය යුතු ය. සමිතියේ මුල් සාමාජිකයෝ ලියාපදිංචි කළ සමිති වෙත්නම්, ඒ ලියාපදිංචි කළ සමිතිවල අතුරු ව්‍යවස්ථාවලින් අත්සන් කිරීමට බලයලත් කෙනෙකු බැගින් අත්සන් කර තිබිය යුතු ය.

(iii) සමුපකාර සමිතියේ යෝජිත කටයුතු සම්බන්ධයෙන් ආර්ථික සක්‍යතා වාර්තාවක් සමග එවිය යුතු ය.

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ඇමතිතුමාට ආයාචනය කිරීම

3. සමිතියක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්තුමා විසින් ප්‍රතික්ෂේප කළහොත් ලියාපදිංචි කිරීමට යවන ලද ඉල්ලුම් පත්‍රයට අත්සන් කරන ලද ඕනෑම කෙනෙකුට ඊට විරුද්ධව ඇමතිතුමාට ආයාචනයක් ඉදිරිපත් කළ හැකි වන අතර, එවැනි ආයාචනයක් ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම ගැන රෙජිස්ට්‍රාර්තුමා විසින් දන්වන ලද දින සිට දින තිහක් ඇතුළත ලිඛිතව කළ යුතු ය.

4. සමිතියක් ලියාපදිංචි කළ විට රෙජිස්ට්‍රාර්තුමා විසින් -

(i) මේ සමග ඇති උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු ය. ඒ සමගම සමිතියේ පොත් පත් තබන භාෂාවෙන් සකස් කරන ලද ඌව පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ හා ඒ යටතේ පනවා ඇති රීතිවල පිටපත් ද නිකුත් කළ යුතු ය.

(ii) ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රය සමග එවන ලද අතුරු ව්‍යවස්ථා පිටපතක් අත්සන් කර සමිතියට ආපසු යැවිය යුතු ය.

සාමාජිකත්වය

5. ලියාපදිංචි කරන ලද සමිතියකට සාමාජිකයින් ඇතුළත් කරගත යුත්තේ ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථා අනුව හා එම අතුරු ව්‍යවස්ථාවලින් නියමිත කොන්දේසිවලට යටත්ව ය.

6. ඕනෑම ලියාපදිංචි කළ සමිතියකට එහි අතුරු ව්‍යවස්ථා අනුව හා එම අතුරු ව්‍යවස්ථාවලින් නියමිත කොන්දේසිවලට යටත්ව වෙනත් ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකත්වයට ඇතුළත් කර ගත හැකිය.

7. ලියාපදිංචි කළ සමිතියක ඕනෑම සාමාජිකයෙකුට තමාගෙන් සමිතියට අයවිය යුතු ණයක් නොමැති නම් හෝ සමිතියට අයවීමට තිබෙන ණයකට තමා ඇපකරුවෙකු නොවේ නම් හෝ ලේකම්තැනට මසක් කලින් ලියවිල්ලකින් දැනුම් දී සමිතියෙන් අස්විය හැකිය.

8. ලියාපදිංචි කරන ලද සමිතියක අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් යම් කිසි කරුණක් නිසා එම අතුරු ව්‍යවස්ථාවෙහි නියම කර ඇති අන්දමට සාමාජිකයන් අස් කිරීමට සමිතියට බලය ඇති වේ.

9. ලියාපදිංචි කළ සමිතියක ඕනෑම සාමාජිකයෙකුට සාමාජිකත්වය සඳහා සමිතියේ අතුරු ව්‍යවස්ථා වලින් නියමිත සුදුසුකම්වලින් කිසිවක් නැති වී ගියහොත් ඔහුගේ සාමාජිකත්වය ද නැතිවේ. එවිට සමිතියේ කාරක සභාව විසින් ඔහුගේ නම සාමාජික ලේඛනයෙන් අයින් කළ යුතු ය.

10.

(i) සීමාරහිත වගකීම් ඇතිව ලියාපදිංචි කළ සමිතියක යම්කිසි සාමාජිකයෙකු සමිතියෙන් අස් වුවහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත් හෝ ඔහුට අයිති කොටස් ගැනීම සඳහා ඔහු විසින් හෝ ඔහුට කලින් ඒ කොටස් අයිතිව තිබූ කෙනෙකු විසින් හෝ ගෙවන ලද මුදල්, අතුරු ව්‍යවස්ථා වලින් නියමිත කාලය ගත වූවාට පසු පොලියක් නොමැතිව ආපසු ලබා ගැනීමට ඔහුට බලය ඇතිවේ.

(ii) සීමාසහිත වගකීම ඇතිව ලියාපදිංචි කළ සමුපකාර සමිතියක යම් කිසි සාමාජිකයෙකු සමිතියෙන් අස්වුවහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත් හෝ ඔහුට අයිති කොටස් ගැනීම සඳහා ගෙවන ලද මුදල් ආපසු ලබාගත හැක්කේ ඒ සමිතිවල අතුරු ව්‍යවස්ථාවල ඒ සම්බන්ධයෙන් පනවා ඇති කොන්දේසි අනුව පමණක්ම ය.

සාමාජික සංඛ්‍යාව

11. ප්‍රාථමික සමිතියක සාමාජික සංඛ්‍යාවට සීමාවක් නොමැත. එහෙත් නිෂ්පාදන, කාර්මික හෝ කම්කරු සමුපකාර සමිතියක් වූ කලී එහි කටයුතු වත්කම් හා බැරකම් ගැන සලකා බලා එකී සමිතියේ ආර්ථික ප්‍රරෝහණ ශක්තිය තහවුරුවීම් වස්, රෙජිස්ට්‍රාර්තුමාගේ අනුමැතිය ඇති සාමාජික සංඛ්‍යාවට සීමාවක් නියම කළ හැකිය.

සාමාජික නාම ලේඛනය

12. සෑම ලියාපදිංචි කළ සමිතියක් ම පහත සඳහන් කරුණු දක්වන නාම ලේඛනයක් තබාගත යුතු ය.

(i) සෑම සාමාජිකයාගේ නම, ලිපිනය, රක්ෂාව, ඔහුට අයත් කොටස් ගණන,
(ii) එක එක සාමාජිකයාගේ වයස,
(iii) ඒ ඒ සාමාජිකයාගේ නම සාමාජික නාම ලේඛනයෙහි ඇතුළත් කළ දිනය,
(iv) සාමාජිකයකුගේ සාමාජිකත්වය නැති වූ දිනය,
(v) එක එක සාමාජිකයා විසින් නම් කරන ලද තැනැත්තන් වෙතොත් ඔවුන්ගේ නම්,
(vi) එක එක සාමාජිකයාගේ අත්සන හෝ මහපට ඇඟිලි සටහන.

13.

(i) සමුපකාර සමිති ප්‍රඥප්තියේ 32 වැනි වගන්තියේ විධිවිධාන සඳහා ලියාපදිංචි කරන ලද සමිතියක සාමාජිකයෙකු විසින් යම් කිසිවකු නම් කරන විට එය ලිඛිතව කර එය සහතික කරන සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරිපිට අත්සන් කළ යුතු ය. නම් කරනු ලබන අය

(ii) කොටස් ප්‍රාග්ධනය ඇති ලියාපදිංචි කරන ලද සමිතියක සාමාජිකයෙකුට එක කොටසකට වඩා අයිති වුවහොත් මිස එක් කෙනෙකුට වඩා නම් කිරීමට බලයක් නැත.

(iii) ලියාපදිංචි කරන ලද සමිතියක යම්කිසි සාමාජිකයෙකු විසින් එක් කෙනෙකුට වැඩි ගණනක් නම් කළහොත් ඒ එක් එක් තැනැත්තාට පැවරිය යුතු කොටස් ගණන හෝ කොටස්වලින් නියමිත ප්‍රමාණය හෝ ඒ සාමාජිකයාගේ වෙනත් සම්බන්ධතාවයක් සමිතියේ තිබේ නම් එය ඒ එක එක තැනැත්තා අතර බෙදා දිය යුතු ආකාරය ද ඒ නම් කරන අවස්ථාවේදීම සඳහන් කළ යුතු ය.

(iv) නම් කරනු ලබන සෑම තැනැත්තාගේම නම නාම ලේඛනයෙහි සඳහන් කළ යුතු ය.

(v) ලියාපදිංචි කරන ලද සමිතියක අතුරු ව්‍යවස්ථාවල අන්‍ය නියමයක් නොමැති නම්, නම් කරනු ලැබූ කෙනෙකුට සාමාජිකයාගේ මරණින් පසු ඔහුගේ කොටස්වල හෝ අන්‍ය සම්බන්ධතාවයක හෝ අයිතිය පැවරීමේ දී ඒ සාමාජිකයා විසින් ඒ සඳහා ගෙවන ලද මුදලම විය යුතු ය.

(vi) නම් කරනු ලැබූ බාල වයස්කරුවෙකුට යම් කිසි මුදලක් ගෙවූ විට ඔහු විසින් හෝ ඔහුගේ භාරකරු විසින් හෝ දෙන ලද ලදුපත ඒ මුදල් ගෙවන ලද ඒ මුදල් ලියාපදිංචි කළ සමිතියේ වගකීම ඉටු කළ බවට ප්‍රමාණවත් නිදහස් කිරීමක් වේ.

14. වගකීම සීමාසහිත වුව ද සීමාරහිත වුව ද ලියාපදිංචි කළ සමිතියක එහි සම්පූර්ණ කොටස් මුදලින් පහෙන් පංගුවකට වඩා අයිති කර ගැනීමට සාමාජිකත්වය දරන ලියාපදිංචි කළ සමිතියකට හැර අන්‍ය කිසිම සාමාජිකයෙකුට බලය නැති වේ. අයිතිකරගත හැකි උපරිම ප්‍රමාණය

15.

(i) කොටස් ප්‍රාග්ධනයක් නොමැති ලියාපදිංචි කළ සමිතියක නම් එහි මුදල්වලින් කිසිවක් ලාභාංශ වශයෙන් හෝ වෙනත් අන්දමකට හෝ සාමාජිකයින් අතර බෙදිය නොහැකි ය. ලාභ බෙදීම

(ii) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක මුදල් හෝ එයින් යම් කිසි කොටසක් හෝ පහත සඳහන් කරුණු සම්පූර්ණ වුවහොත් මිස ලාභාංශ හෝ ප්‍රතිපාදන හෝ ප්‍රසාද මුදල් හෝ වශයෙන් ඒ සාමාජිකයන් හෝ නිලධාරීන් අතර නොබෙදිය හැකිය :

(අ) ශුද්ධ ලාභය ගණන් ගැනීමට පෙර වර්ෂය තුළ සමිතියට ඇතිවී තිබෙන සම්පූර්ණ වියදම ලාභ අලාභ ගිණුමට හර කර තිබීම ; හා

(ආ) රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ණ අනුමැතිය ලබා ගැනීම.

(iii) ලියාපදිංචි කළ සමිතියකින් තැන්පත්කරුවෙකුට හෝ ණය හිමියකුට හෝ ගෙවිය යුතු යම් කිසිවක් නොගෙවා තිබිය දී ලාභාංශ වශයෙන් හෝ ප්‍රතිපාදන වශයෙන් හෝ කිසිවක් ගෙවිය නොහැකි ය.

(iv) පූර්ව වර්ෂයේ අවසාන ශේෂයේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය සඳහා 10%කට අධික වන පරිදි ලාභාංශ ගෙවීමට කිසිම ලියාපදිංචි කළ සමිතියකට බලයක් නොමැති ය.

(v) බැංකුවක් හැර සාමාජිකයෙක් නොවන අන් කිසිවෙකුගෙන් ණය හෝ තැන්පත් හෝ වෙනත් ණය පහසුකම් හෝ ලබන තෙක් කිසිම ලියාපදිංචි කළ සමිතියක් -

(අ) ලාභාංශ නොගෙවිය යුතු යැයි හෝ,

(ආ) රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කළ හැකි අඩු ප්‍රමාණයකට ලාභාංශ ගෙවිය යුතු යැයි හෝ රෙජිස්ට්‍රාර්තුමා විසින් සාමාන්‍ය හෝ විශේෂ නියෝගයකින් අණ කළ හැකි ය.

සමිතියේ උපරිම වගකීම

16.

(i) සෑම ලියාපදිංචි කළ සමිතියක්ම ණය වශයෙන් හෝ තැන්පත් වශයෙන් හෝ වෙනත් අයුරින් හෝ සාමාජිකයන් නොවන්නන්ගෙන් ලබාගත හැකි උපරිම ප්‍රමාණය සමිතියේ මහා සභා රැස්වීමක දී වරින් වර නියම කර ගත යුතු ය.

(ii) මේ රීතියේ (1) වැනි ඡේදයේ සඳහන් පරිදි උපරිම ප්‍රමාණයක් නියම කිරීමෙන් යම්කිසි ලියාපදිංචි කරන ලද සමිතියකට දුෂ්කරතාවයක් ඇති වේ යැයි රෙජිස්ට්‍රාර්තුමාට වැටහුනහොත් අවශ්‍යයැයි තමා සළකන යම්කිසි කාල පරිච්ඡේදයකට එකී සමිතියට එවැනි උපරිම ප්‍රමාණයක් නියම කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

මහා සභා රැස්වීම

17.

(i) සෑම ලියාපදිංචි කරන ලද සමිතියක්ම පහත සඳහන් කරුණු ඇතුළුව අවශ්‍ය කටයුතු කිරීම සඳහා එහි අතුරු ව්‍යවස්ථාවල සඳහන් පරිදි මහා සභා රැස්වීම් කලින් කල පැවැත්විය යුතු ය :-

(අ) ණය වශයෙන් හෝ තැන්පත් වශයෙන් හෝ වෙනත් අයුරින් හෝ සාමාජිකයින් නොවන්නන්ගෙන් ලබාගත හැකි උපරිම ප්‍රමාණය නියම කිරීම ;

(ආ) සාමාජිකයන්ට ණය දෙන සමිතියක් නම් එක එක සාමාජිකයාට දිය හැකි උපරිම ණය ප්‍රමාණය නියම කිරීම ;

(ඇ) කාරක සභිකයින් තෝරාපත් කිරීම ;

(ඈ) රෙජිස්ට්‍රාර්තුමාගේ වාර්තාවක් වෙතොත් එය ද ගිණුම් පිළිබඳ වාර්තාව ද රෙජිස්ට්‍රාර්තුමා විසින් පත් කරන ලද ගණන් පරීක්ෂකගේ වාර්තාව ද සලකා බැලීම.

(ii) ලියාපදිංචි කරන ලද සමිතියක මහා සභාව වෙත ඉදිරිපත් වන සෑම කරුණක්ම අතුරු ව්‍යවස්ථාවල අන්‍ය පිළිවෙලක් නිශ්චය වශයෙන් සඳහන් කර නොමැති නම් ඒ ඒ රැස්වීමට පැමිණ ඡන්දය දෙන අයගේ වැඩි ඡන්දය අනුව තීරණය විය යුතු ය.

සමුපකාර සමිති ප්‍රඥප්තියේ 6(1)(අ) වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සමිතියක සාමාජිකයෙකුට ඒ සමිතියේ මහා සභා රැස්වීමේ දී හිමි වන්නේ එක් ඡන්දයක් පමණක්ම ය. ලියාපදිංචි කරන ලද සමිතියක නියෝජිතයන්, වෙනත් ලියාපදිංචි කරන ලද සමිතියක මහා සභා රැස්වීමකට පැමිණි විට, ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථා අනුව ඡන්දය පාවිච්චි කළ යුතු ය. ඡන්ද ගණන සමාන වූ විට සභාපතිතැනට තීරක ඡන්දයක් ඇති වේ.

(iii) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙක් වන වෙනත් ලියාපදිංචි කළ සමිතියක් ඒ සමිතියේ මහා සභා රැස්වීමක දී තම සමිතිය නියෝජනය කිරීමට තම සාමාජිකයන් අතුරින් පහත සඳහන් අය පත් නොකළ යුතු වේ :-

(අ) තමා විසින් ගන්නා ලද ණයක් හෝ ණය හෝ ඒ සමිතියට හෝ ලියාපදිංචි කළ වෙනත් සමිතියකට හෝ ලියාපදිංචිය අවලංගු කරන ලද සමිතියක ඇවරකරුට හෝ ආපසු ගෙවීම, ඒ ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් නියමිත යම්කිසි කාලයක් හෝ එසේ කාලයක් නියම කර නොමැති නම්, තුන් මසකට අධික කාලයක් හෝ අතපසු කර තිබෙන කෙනෙක් ;

(ආ) ඒ සමිතියට හෝ ලියාපදිංචි කළ වෙනත් සමිතියකට හෝ ඈවරකරුවෙකුට හෝ වෙනයම් කිසිම කාරණයක් නිසා ගෙවිය යුතු මුදලක් ගෙවීම අතපසු කර ඇති කෙනෙක්.

මහා සභා රැස්වීම හෝ කාරක සභා රැස්වීම් කැඳවීමටත් ඒවාට පැමිණීමටත් රෙජිස්ට්‍රාර්තුමා වෙත ඇති වන බලතල

18.

(i) රෙජිස්ට්‍රාර්තුමාට ද, සාමාන්‍ය හෝ විශේෂ නියෝගයකින් එතුමාගෙන් ඒ සඳහා බලයලත් කෙනෙකුට ද, ඕනෑම අවස්ථාවක දී තමා නියම කරන අයුරු නියම කරන වේලාවක හා ස්ථානයක දී ඕනෑම ලියාපදිංචි කළ සමිතියක විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට බලය ඇති වේ. එවැනි රැස්වීමක දී මහා සභාවේ රැස්වීමට පැමිණි ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයින්ගෙන් හෝ නියෝජිතයින්ගෙන් 10 දෙනෙකු පැමිණ සිටීම ගණපූරණය වන්නේ ය. එවැනි මහා සභා රැස්වීමකට අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීමේ බලය ඇතුළුව සමිතියේ යථා පරිදි කැඳවන ලද මහා සභා රැස්වීමකට ඇති සියලුම බලතල හිමි වේ.

(ii) රෙජිස්ට්‍රාර්තුමාට ද, එතුමාගෙන් ඒ සඳහා ලිඛිත බලයලත් කෙනෙකුට ද, ඕනෑම ලියාපදිංචි කරන ලද සමිතියක කාරක සභා රැස්වීමක් ඕනෑම අවස්ථාවක දී තමන් නියම කරන අයුරු නියම කරන වේලාවක හා ස්ථානයක දී කැඳවීමට බලය ඇති වේ. එවැනි රැස්වීමක දී පැමිණ සිටින සංඛ්‍යාව (තුනකට අඩුවුවහොත් මිස) ගණපූරණය වන්නේ ය. එවැනි කාරක සභා රැස්වීමකට සමිතියේ යථා පරිදි කැඳවන ලද කාරක සභා රැස්වීමක ඇති සියලු බලතල හිමි වේ.

(iii) රෙජිස්ට්‍රාර්තුමා විසින් හෝ රෙජිස්ට්‍රාර්තුමාගෙන් බලයලත් කෙනෙකු විසින් හෝ 18(i) රීතිය යටතේ විශේෂ මහා සභා රැස්වීමක් හෝ 18(ii) රීතිය යටතේ කාරක සභා රැස්වීමක් හෝ කැඳවූ විට අවශ්‍ය යැයි තමාට වැටහෙන සමිතියේ පොත් පත් හෝ ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියෝග කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට හෝ එසේ බලයලත් තැනැත්තෙකුට හෝ බලය ඇති වේ. එවැනි සෑම නියෝගයක්ම අනුව ක්‍රියා කිරීම සමිතියේ ලේකම්තැනගේ යුතුකම වේ. රෙජිස්ට්‍රාර්තුමාට හෝ එතුමාගෙන් බලයලත් කෙනෙකුට හෝ 18(i) හෝ 18(ii) රීතිය යටතේ කැඳවන ලද ඕනෑම රැස්වීමක මුලසුන දැරීමට හැකි ය. එහෙත් ඒ අයට ඡන්දයක් හිමි වන්නේ නැත. ඡන්ද ගණන සමාන වූ විට සභාපතිතැනට තීරක ඡන්දයක් දිය හැකිය.

(iv) රෙජිස්ට්‍රාර්තුමාට හෝ විශේෂ හෝ සාමාන්‍ය ලිඛිත නියෝගයකින් එතුමාගෙන් බලයලත් කෙනෙකුට හෝ ඕනෑම ලියාපදිංචි කළ සමිතියක මහා සභා රැස්වීමකට හෝ කාරක සභා රැස්වීමකට හෝ පැමිණීමටත් එහිදී කතා කිරීමටත් බලය ඇති වේ. එහෙත් රෙජිස්ට්‍රාර්තුමාට හෝ එතුමාගෙන් බලයලත් කෙනෙකුට හෝ එවැනි රැස්වීමකදී ඡන්දය දීමේ බලය ඇති නොවේ.

කාරක සභාව

19. සෑම ලියාපදිංචි කරන ලද සමිතියකම කාරක සභාවක් තිබිය යුතු ය. ලියාපදිංචි කරන ලද සමිතියක කාරක සභිකයින් තෝරා පත් කිරීම, ඔවුන්ගේ වැඩ අත්හිටුවීම හෝ ඔවුන් කාරක සභාවෙන් ඉවත් කිරීම සමිතියේ අතුරු ව්‍යවස්ථාව අනුව කළ හැකිය. ලියාපදිංචි කරන ලද සමිතියක අතුරු ව්‍යවස්ථා අනුව ප්‍රාදේශික කාරක සභාව පිහිටුවීමට අවකාශ ඇත්තේ නම් එවැනි ප්‍රාදේශික කාරක සභාවක සාමාජිකයින් තෝරා පත් කිරීම ඔවුන්ගේ වැඩ අත්හිටුවීම හා ඔවුන් එම ප්‍රාදේශික කාරක සභාවෙන් ඉවත් කිරීම අතුරු ව්‍යවස්ථාව පරිදි කළ හැකි ය.

අලුත් සමුපකාර සමිතියක් ලියාපදිංචි කළ විට ඉහත සඳහන් විධිවිධාන කෙසේ වෙතත් එය නොතකා ඒ සමිතියේ තාවකාලික අධ්‍යක්ෂ මණ්ඩලයකට පුද්ගලයින් නම් කිරීමටත් ඒ තාවකාලික අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඒ පුද්ගලයන් ඉවත් කිරීමටත් රෙජිස්ට්‍රාර්තුමාට බලය ඇති වේ. රෙජිස්ට්‍රාර්තුමා විසින් නම් කරනු ලබන තාවකාලික අධ්‍යක්ෂ මණ්ඩලයකට මහා සභාව හා කාරක සභාවක සියලු බලතල හිමි වේ. එහෙත් එසේ නම් කරන ලද මණ්ඩලයකට දොලොස් මසකට අධික කාලයක් ක්‍රියා කළ හැකි නොවේ.

20. ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථාවල විධානයන් කෙසේ වෙතත් එම සමිතියේ කාරක සභාවකට එක් කෙනෙකු හෝ වැඩි දෙනෙකු නම් කිරීමටත් එසේ නම් කරන ලද අය අතුරින් සභාපති හෝ උප සභාපති හෝ ඒ දෙදෙනාම හෝ නම් කිරීමටත් රෙජිස්ට්‍රාර්තුමාට බලය ඇති වේ. රෙජිස්ට්‍රාර්තුමා විසින් සභාපති හෝ උප සභාපති හෝ එසේ නම් කළ විට කාරක සභාව විසින් තෝරා පත් කරන ලද සභාපතිගේ හෝ උප සභාපතිගේ හෝ නිලය එම නම් කිරීමෙන් අහිමි වේ.

21.

(i) ලියාපදිංචි කළ සමිතියක කාරක සභාවට හෝ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශික කාරක සභාවට හෝ තෝරා පත් කරනු ලැබූ කෙනෙක් එසේ තෝරා පත් වූ විගසම තමා එසේ තෝරා පත් කිරීමට නුසුදුසු නොවන බවට ප්‍රකාශනයක් සමිතියේ අතුරු ව්‍යස්ථාවල නියමිත ආකාරයට කළ යුතු ය.

(ii) කාරක සභාවට හෝ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශික කාරක සභාවකට හෝ තෝරා පත් කර ගන්නා ලද කෙනෙක් 21(i) රීතිය අනුව ප්‍රකාශනයක් කළ විට ඒ ප්‍රකාශනය අසත්‍ය යැයි දැනගන්නට ලැබුනොත් ඒ ප්‍රකාශනය අසත්‍ය බව දැනගන්නට ලැබී තුන් වර්ෂයක කාලයක් ගත වනතුරු කිසිම සමුපකාර සමිතියක කිසිම නිලයක් දැරීමට ඔහු නුසුදුසු වේ.

22.

(i) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක කාරක සභාවේ සාමාජිකයෙකුට වැටුප් මුදල්, පාරිතෝෂික මුදල් හෝ වෙනත් පාරිශ්‍රමිකයක් ලබා ගැනීමට පුලුවන් වන්නේ මහ සභාවේ පූර්ව අනුමැතිය ඇතිවත් රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන ප්‍රමාණය අනුවත් පමණක් ය.

(ii) ලියාපදිංචි කළ සමිතියක කාරක සභිකයෙකු හෝ වෙනත් නිලධාරියකු හෝ තමාගේ සේවය සඳහා ලබා නොගත යුතු යම් මුදලක් ලබාගතහොත් ඒ මුදල සමිතියට ආපසු ගෙවන ලෙස නියම කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය ඇති වේ.

23. ලියාපදිංචි කළ සමිතියක මහ සභාවට වෙන් කර තිබෙන බලතල හැර සමිතියේ අන්‍ය සියලුම බලතල සමිතියේ මහ සභා රැස්වීමක දී හෝ අතුරු ව්‍යවස්ථාවලින් හෝ යථා පරිදි නියම කරන ලද රෙගුලාසිවලට හෝ සීමාවලට යටත්ව කාරක සභාව සතු වේ.

24. ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව වෙත පැවරෙන වෙනත් කටයුතු කළ යුතු අතර, පහත සඳහන් කටයුතු ද කළ යුතු වේ :-

(අ) සමුපකාර සමිති ප්‍රඥප්තිය, මේ රීති, සමිතියේ අතුරු ව්‍යවස්ථා හා කාරක රීති හා සමිතියේ කටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්තුමා විසින් නිකුත් කරන වෙනත් සාමාන්‍ය විධානයන් අනුගමනය කිරීම ;

(ආ) සත්‍ය වූ ද, නිවැරදි වූ ද ගණන් තැබීම ;

(ඇ) වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් සත්‍ය ගිණුම් තැබීම ;

(ඈ) සමිතියේ වත්කම් සුරක්ෂිතව තබා ගැනීමට විධිවිධාන සැලැස්වීම ;

(ඉ) නිවැරදි සාමාජික ලේඛනයක් තැබීම ;

(ඊ) පරික්ෂිත ලාභ අලාභ ගිණුම හා ශේෂ පත්‍රය ද ගණන් පරීක්ෂකතැනගේ වාර්තාව ද රෙජිස්ට්‍රාර්තුමාගෙන් ලැබී දෙමසක් ඇතුළත සමිතියේ මහා සභා රැස්වීමකට ඉදිරිපත් කිරීම ;

(උ) සමිතියේ පොත්පත් බැලීමට බලයලත් ඕනෑම කෙනෙකුට ඒවා පරීක්ෂා කිරීමට උපකාර කිරීම ;

(ඌ) සමිතියේ සාමාජිකයින්ට ණය මුදල් දුන් විට ඒ ණය මුදල් දෙන ලද කටයුත්ත සඳහාම පරිහරණය කරන බව සොයා බැලීම ;

(එ) සමුපකාර සමිති ප්‍රඥප්තියේ 52 වැනි වගන්තිය අනුව රෙජිස්ට්‍රාර්තුමා විසින් දන්වා එවන අඩුලුහුඩුකම් මග හරවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

25. ලියාපදිංචි කළ සමිතියක් රජයේ හෝ වෙනත් සංයුක්ත මණ්ඩලයක හෝ නියෝජිතයෙකු වශයෙන් සේවය කරන කල ඒ බලධාරියා විසින් නිකුත් කරනු ලබන උපදෙස් අනුව ඒ සේවය ඉටු කිරීම කාරක සභාවේ හා සෑම නිලධාරියෙකුගේ ද, සේවකයෙකුගේ ද යුතුකම වේ.

26. ලියාපදිංචි කරන ලද සමිතියක කාරක සභාව තම කාර්යය හා යුතුකම් බුද්ධිමත්ව ඉටුකළ යුතු ය. සෑම විටම ඔවුන් නීතිය, මේ රීති, සමිතියේ අතුරු ව්‍යවස්ථා හා කාරක රීතිවල විධිවිධාන අනුව ද සමිතියේ කටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්තුමා විසින් නිකුත් කරන සාමාන්‍ය විධාන අනුව ද ක්‍රියා කළ යුතු ය. කාරක සභාව නිසි පරිදි බුද්ධිමත් ලෙස ක්‍රියා නොකිරීම නිසා හෝ නීතිය, මේ රීති, සමිතියේ අතුරු ව්‍යවස්ථා හා කාරක රීති අනුව ද රෙජිස්ට්‍රාර්තුමාගේ සාමාන්‍ය විධාන අනුව ද ක්‍රියා නොකිරීම නිසා සමිතියට ඇතිවන යම් කිසි අලාභයකට හෝ පීඩාවකට හෝ සමිතිය යටත් වන යම් දඬුවමකට හෝ කාරක සභිකයින් සාමූහිකව හා වෙන් වෙන්ව වගකිව යුතු වේ.

27. ලියාපදිංචි කළ සමිතියක් ණය දෙන සමිතියක් නම් එහි කාරක සභිකයින්ගේ ණයවල එකතුව සමිතියේ කාරක ප්‍රාග්ධනයෙන් සියයට විසිපහකට වැඩි නොවිය යුතු ය. එහෙත් රෙජිස්ට්‍රාර්තුමාගේ අදහස පරිදි සමිතියේ සියලුම සාමාජිකයින්ගේ ණය අවශ්‍යතා තරම් වන මුදල් ඇති සමිතියක් කෙරෙහි නම් මේ රීතිය බලපාන්නේ නැත.

නිලධාරීන් හා සේවකයන්

28. ලියාපදිංචි කළ සමිතියකට 2011 අංක 3 දරන ඌව පළාතේ සමුපකාර සමිති ප්‍රඥප්තිය සහ 2010 අංක 04 දරන ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යන ප්‍රඥප්තිවල විධිවිධාන අනුව මිස කිසිවකු සේවකයෙකු වශයෙන් පත් කළ නොහැකිය.

අනිවාර්ය අතුරු ව්‍යවස්ථා

29. ලියාපදිංචි කළ සමිතියක් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කළ යුතුය.

(i) සමිතියේ නම ;
(ii) සමිතියේ ලිපිනය ;
(iii) සමිතියේ පරමාර්ථ ;
(iv) සමිතියේ මුදල් යෙදවිය හැකි කරුණු ;
(v) සමිතියේ සාමාජිකත්වයට සුදුසුකම්, සාමාජිකයින් ඇතුළත් කර ගැනීමේ කොන්දේසි, ඇතුළත් කර ගැනීමේ ආකාරය ;

(vi) සමිතියේ සාමාජිකයින්ගේ වගකීමේ ප්‍රමාණය හා ස්වභාවය ;
(vii) සමිතියේ සාමාජිකයින් අස්වීම හා ඉවත් කිරීම හා ඔවුන්ට කළ යුතු ගෙවීම් ;
(viii) සමිතියේ සාමාජිකයින්ගේ කොටස් හා වෙනත් සම්බන්ධතාවයන් පැවරීම ;
(ix) තැන්පත් සඳහා උපරිම පොලී ප්‍රමාණය ඇතුළුව සමිතියේ මුදල් සපයා ගන්නා ආකාරය ;
(x) සමිතියේ මහ සභා රැස්වීම් හා ඒ සභා රැස්වීම් පැවැත්වීමේ පිළිවෙල හා සභා රැස්වීම්වල බලතල ;
(xi) සමිතියේ කාරක සභිකයින් හා වෙනත් නිලධාරීන් පත්කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම හා ඔවුන් සේවයෙන් ඉවත් කිරීම හා කාරක සභාවේ හා වෙනත් නිලධාරීන්ගේ බලතල හා යුතුකම් ;
(xii) සමිතිය වෙනුවෙන් ලියකියවිලි අත්සන් කිරීමට සමිතියේ නිලධාරියකුට බලය දීම සාමාජිකයින්ට ණය දීම සඳහා මුදල් සපයා ගැනීම ලියාපදිංචි කළ සමිතියක පරමාර්ථවලට ඇතුළත් නම්, පහත සඳහන් අතිරේක කරුණු සම්බන්ධයෙන් ද අතුරු ව්‍යවස්ථා සකස් කර ගත යුතු ය ;
(xiii) සාමාජිකයින්ගේ රක්ෂාව හා පදිංචිය ;
(xiv) පහත සඳහන් කරුණු ඇතුළුව සාමාජිකයින්ට ණය දීමේ කොන්දේසි :-
(අ) පොලී ප්‍රමාණය ;
(ආ) සාමාජිකයෙකුට ණය දිය හැකි උපරිම ප්‍රමාණය ;
(ඇ) ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම හා ණය අලුත් කිරීම ;
(ඈ) ණය දිය යුතු කරුණු ;
(ඉ) ණය වෙනුවෙන් ලබා ගන්නා ඇප ;
(xv) කොටස් වෙනුවෙන් හෝ ණය වෙනුවෙන් හෝ ගෙවීමට තිබෙන මුදලක් ගෙවීම පැහැර හැරීමේ ප්‍රතිඵල ;
(xvi) ලාභ පිළිබඳ සුදුස්සක් කිරීම.

කාරක රීති

30. ලියාපදිංචි කළ සමිතියක් අවශ්‍ය යැයි වැටහෙන පරිදි එහි අතුරු ව්‍යවස්ථාවලට යටත්ව වරින්වර කාරක රීති සකස් කර ගත යුතු ය. කාරක සභාව ද, සෑම නිලධාරියා සේවකයා ද, ඒ කාරක රීති අනුව ක්‍රියා කිරීමට බැඳී සිටී.

අලාභ

31. ලියාපදිංචි කළ සමිතියක් විසින් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 28(1) (ආ) වගන්තිය යටතේ කිසිම සාමාජිකයෙකුගෙන් අයකර ගත හැකි අලාභ වනාහි ඒ සාමාජිකයා විසින් තමා නිපදවන ද්‍රව්‍ය සියල්ලම හෝ එයින් නියමිත කොටසක් හෝ සමිතිය මගින් නොවිකිණීම හේතු කොට ගෙන සමිතියට නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ නැතිවන වෙළඳාම නිසා ඇතිවන අලාභය වේ. එහෙත් සමිතියේ අය කරන අලාභය සමිතිය මගින් නොවිකුණන ලද ඒ ද්‍රව්‍යවල එවකට පවතින වෙළඳපොල මිල සහ ඉන් සියයට 10ට වැඩි නොවිය යුතු ය.

අයිතිවාසිකම් අතහැර දැමීම

32. ලියාපදිංචි කළ සමිතියකට අය විය යුතුව ඇති ණයක් හෝ වෙනත් හිමිකමක් හෝ මහ සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව අතහැර දැමීමට හෝ සමිතියේ පොත්පත්වලින් අස්කර දැමීමට නොහැකි ය. ඒ ණය හෝ හිමිකම හෝ රු. 5,000කට අධික මුදලක් සම්බන්ධ එකක් වේ නම් මහ සභාවේ හා රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය නොමැතිව අත්හැර දැමීමට හෝ සමිතියේ පොත්පත්වලින් අස්කර දැමීමට නොහැකි ය.

අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම

33.
(i) ලියාපදිංචි කළ සමිතියකට සමුපකාර ප්‍රඥප්තියේ 11 වැනි වගන්තියේ විධිවිධාන හා මේ රීතිවලට 29 වැනි රීතිය යටතේ එහි අතුරු ව්‍යවස්ථා සංශෝධනය කළ හැකිය.

(ii) අතුරු ව්‍යවස්ථාව සංශෝධනයක් කළ හැක්කේ පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මහ සභාවට යෝජනාවක් අනුව පමණක් ය :-

(අ) සීමාරහිත වගකීම් ඇති සමිතියක් නම් ඒ මහ සභා රැස්වීමට සමිතියේ සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් භාගයකට අඩු නොවන ගණනක් පැමිණ සිටිය යුතු ය. තව ද ඒ පැමිණ සිටින සාමාජිකයින්ගෙන් යටත් පිරිසෙයින් 3/4ක් වත් යෝජනාවට කැමැත්ත දිය යුතුය ;

(ආ) සීමාසහිත වගකීම් ඇති සමිතියක් නම් ඒ සමිතියේ මහ සභා රැස්වීමට පැමිණ ඡන්දය දීමට බලය ඇති සම්පූර්ණ සංඛ්‍යාවෙන් භාගයකට වැඩි ගණනක ඡන්දය යෝජනාවට පක්ෂව ලැබිය යුතු ය. ඒ ඡන්ද ලිඛිතව දිය හැකි වේ. ලිඛිත ඡන්ද ලබා ගන්නා විට ඡන්ද පත්‍රිකා ඒ සියලුම දෙනාට යවා ආපසු ලැබෙන ඡන්ද සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් නියමිත ගණපූර්ණයක් ඇති මහ සභා රැස්වීමක දී පරීක්ෂා කර ගණන් කළ යුතු ය.

(iii) මේ රීතියේ ඉහත දැක්වෙන විධිවිධාන කෙසේ වෙතත් රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය හෝ නිර්දේශය ලැබී ඇති ඕනෑම අතුරු ව්‍යවස්ථාවක් හෝ අතුරු ව්‍යවස්ථාවක සංශෝධනයක් හෝ ඒ යෝජිත අතුරු ව්‍යවස්ථාව හෝ අතුරු ව්‍යවස්ථාවේ සංශෝධන ගැන සාකච්ඡා කරන බවට සාමාජිකයන්ට යථා පරිදි දන්වා පවත්වන ලද මහ සභාවකට පැමිණ සිටින සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකොටසකගේ ඡන්දයෙන් සභා සම්මත කර ගත හැකිය.

(iv) ලියාපදිංචි කළ සමිතියක යම්කිසි අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ වහාම එයින් පිටපත් දෙකක් රෙජිස්ට්‍රාර්තුමා වෙත යැවිය යුතු ය. තව ද මේ රීතියේ අවස්ථාවෝචිත පරිදි (ii) හෝ (iii) ඡේදයේ විධිවිධාන සර්වප්‍රකාරයෙන්ම ඉටු කළ බවට සමිතියේ සභාපති හා ලේකම් විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක් ඒ සමග යැවිය යුතුය.

දඩ ගැසීම

34. ලියාපදිංචි කළ සමිතියකට එහි අතුරු ව්‍යවස්ථා කඩ කිරීම නිසා සාමාජිකයන්ට දඩ ගැසීමට අතුරු ව්‍යවස්ථාවලින් අවකාශ සැලසිය හැකි ය. ඒ අතුරු ව්‍යවස්ථාවලින් වෙනත් කරුණු අතරම පහත සඳහන් කටයුතු කිරීමට අවකාශ සැලසිය යුතු ය :-

(අ) එවැනි දඩයක් ගැසීමට අදහස් කරන බව හා ඊට හේතු ලියවිල්ලකින් දන්වා සිටීම. එවැනි දැන්වීමක් සමිතියේ පොත් පත්වල සඳහන් සාමාජිකයාගේ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමට හෝ සාමාජිකයාට අතින් භාරදීමට හෝ ව්‍යවස්ථා සකස් කිරීම ;

(ආ) අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධයෙන් තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට ඒ සෑම සාමාජිකයාටම දින 14ක් කල් දීමට ඉඩ තැබීම ;

(ඇ) සාමාජිකයා විසින් නිදහසට කරුණු ඉදිරිපත් නොකළ විට රු. 100 කට අධික නොවන දඩයක් ගැසීමට ව්‍යවස්ථාව සකස් කිරීම ;

(ඈ) සාමාජිකයා නිදහසට කරුණු ඉදිරිපත් කළහොත් ඒ කරුණු නිසි පරිදි කැඳවන ලද කාරක සභා රැස්වීමක දී සලකා බැලීමට සැලසීම හා සාමාජිකයාගෙන් නිදහසට කරුණු ලැබුනත් දඩයක් ගැසීමට තීරණය කළ විට ඒ දඩය රු. 100ට අධික නොවීමට ව්‍යවස්ථා සකස් කිරීම.

ණය දීම සීමා කිරීම

35. ලියාපදිංචි කළ සමිතියක් විසින් සාමාජිකයෙකු නොවන කෙනෙකුට කිසිම ණයක් නොදිය යුතුය. එහෙත් ලියාපදිංචි කළ සමිතියකට රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය ඇතිව වෙනත් ලියාපදිංචි කළ සමිතියකට ණය දිය හැකිය.

සමිතියේ අරමුදල් ආයෝජනය කිරීම

36. ලියාපදිංචි කළ සමිතියකට එහි මුදල් රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය ඇතිව පොදු හෝ පෞද්ගලික ආයතනයක හෝ ආයෝජනය කිරීමට පුළුවන. එහෙත් එසේ කළ හැක්කේ එසේ ආයෝජනය කිරීමට ඒ පොදු හෝ පෞද්ගලික හෝ ආයතනයට විශේෂ අවකාශ ලැබී ඇතහොත් ය.

ගිණුම්

37. සෑම ලියාපදිංචි කළ සමිතියක්ම රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන ලද ගණන් පොත් හා වෙනත් ලියකියවිලි තබාගත යුතු ය. සමිතියේ ගිණුම් තැබීමට සුදුසුකම් ඇති අය සේවයට බඳවා ගන්නා බවටත්, සමිතියේ ගිණුම් පොත් නිසි පරිදි තබන බවටත්, සමිතියේ පොත්පත් හා ඒ ලියකියවිලි කලට වේලාවට ලියා තබන බවටත්, වග බලා ගැනීම කාරක සභාවේ යුතුකමක් වේ. සමිතියේ ඒ ඒ ගිණුම් පොත් හා වෙනත් ලියකියවිලි තබන ඒ ඒ අය දක්වන ලේඛනයක් සමිතිය විසින් පවත්වාගෙන යන බවට කාරක සභාව විසින් වග බලා ගත යුතු ය. ඒ ඒ පොත්පත් හා වෙනත් ලියකියවිලි තබා ගැනීමේ වගකීම තමා භාර ගත් බවට ඒ ඒ අය විසින් ඒ ලේඛනයෙහි නිසි පරිදි අත්සන් තැබිය යුතු ය. ගිණුම් පොත් වෙනත් ලියකියවිලි කලට වේලාවට තැබීමට අවශ්‍ය සුදුසුකම් ඇති අය සමිතියේ සේවයට බඳවා ගැනීම ඕනෑකමින්ම පැහැර හරින හෝ එවැනි ගිණුම් පොත් හා වෙනත් ලියකියවිලි යථා පරිදි තබන බවට වග බලා නොගන්නා හෝ කාරක සභාවක් වරදකට වරදකරුවෙක් වේ.

38. සෑම ලියාපදිංචි කරන ලද සමිතියක්ම සාමාජිකයෙකු වශයෙන් හෝ තැන්පත්කරුවෙකු වශයෙන් හෝ ණය හිමියෙකු වශයෙන් හෝ එහි මුදල් සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වන ඕනෑම කෙනෙකුට එහි වාර්ෂික ශේෂපත්‍රය පරීක්ෂා කර බැලීමට අවකාශ සලසා දිය යුතුය.

39. සෑම ලියාපදිංචි කරන ලද සමිතියකම කාරක සභාව හෝ කාරක සභාව විසින් ඒ සඳහා පත් කරන ලද සමිතියේ නිලධාරියෙකු හෝ රෙජිස්ට්‍රාර්තුමා විසින් ඒ සඳහා නියම කළ හැකි ආකාරයට වර්ෂයක් පාසා පහත සඳහන් ලේඛන පිළියෙල කර රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන කාලයක් ඇතුළත එතුමා වෙත ඉදිරිපත් කළ යුතුය :-

(i) ශේෂ පිරික්සුම ;
(ii) ආදායම් ප්‍රකාශය ;
(iii) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ;
(iv) මුදල් ප්‍රවාහ ප්‍රකාශය ;
(v) ශේෂ පත්‍රය ;
(vi) විස්තරාත්මක සටහන් හා ගිණුම් ප්‍රතිපත්ති.

විගණනය සඳහා වාර්ෂික මුදල් ප්‍රකාශන සමග අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර, එම මූල්‍ය ප්‍රකාශන ගිණුම් ප්‍රමිති අනුව සකස් කර තිබිය යුතු ය.

40.

(i) ඕනෑම ලියාපදිංචි කළ සමිතියකට පහත සඳහන් කටයුතු කරන ලෙස ලියවිල්ලකින් අණ කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ :-

(අ) ඒ නියෝගයෙන් නිශ්චය කළ හැකි සමිතියේ ගිණුම් හා පොත්පත් රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන යම් කිසි දිනයක් දක්වා ලියවීම ;
(ආ) තමාට අවශ්‍ය ඕනෑම වාර්තාවක් ඒ නියෝගයේ සඳහන් කාලයක් ඇතුළත එහි සඳහන් ආකාරයට එවීම.

(ii) ඕනෑම ලියාපදිංචි කරන ලද සමිතියක් (i) ඡේදය යටතේ කරන ලද නියෝගයක් අනුව ක්‍රියා නොකළහොත් රෙජිස්ට්‍රාර්තුමා විසින් බලය පවරන ලද ඕනෑම කෙනෙකු ලවා ඒ ගිණුම් හෝ පොත්පත් ලියවා ගැනීමටත් වාර්තා සකස් කරවා ගැනීමටත් රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

රෙජිස්ට්‍රාර්තුමා විසින් බලය පවරන ලද ඕනෑම කෙනෙකු ලවා යම් කිසි සමිතියක ගිණුම් හා පොත්පත් ලියවූ විටත් වාර්තා සකස් කරවා ගත් විටත් ඒ සඳහා ගෙවිය යුතු ගාස්තු නියම කර ඒ ප්‍රමාණය ගෙවන ලෙස සමිතියට අණ කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ. ඒ මුදල සමිතිය විසින් නොගෙවුවහොත් ඒ ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්කෙනෙකු වෙත ඉල්ලුම් කර එය අයකර ගැනීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ. එසේ ඉල්ලා සිටි විට ඒ මහේස්ත්‍රාත්තුමා තමා විසින් පනවනු ලැබූ දඩයක් වශයෙන් ඒ ප්‍රමාණය අය කර ගැනීමට ක්‍රියා කළ යුතු ය.

ලියාපදිංචි කරන ලද සමිතියක පොත්පත් ලිවීමට රෙජිස්ට්‍රාර්තුමා විසින් බලය පවරන ලද තැනැත්තෙකු රජයේ නිලධාරියෙක් වේ නම් ඔහුට ගෙවන ලද හෝ ඒ සඳහා අයකර ගන්නා ලද හෝ මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

41.

(i) ලියාපදිංචි කළ සමිතියක විගණනය රෙජිස්ට්‍රාර්තුමා විසින් බලය පවරන ලද්දා වූ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකු විසින් හෝ රෙජිස්ට්‍රාර්තුමා විසින් පත් කරන ඕනෑම සහතික ලත් ගණන් පරීක්ෂකවරයෙකු විසින් හෝ කළ යුතුය. විගණනය

මේ රීතිවල විධිවිධාන සඳහා සහතික ලත් ගණන් පරීක්ෂකවරයෙකු වනුයේ,

(අ) වරලත් ගණකාධිකාරිවරයෙකු හෝ වරලත් ගණකාධිකාරවරුන්ගේ සමාගමක් හෝ,
(ආ) රෙජිස්ට්‍රාර්තුමා විසින් පවත්වාගෙන යන ගණන් පරීක්ෂකවරුන්ගේ ලේඛනයට නම ඇතුළත් වී ඇති කෙනෙක් හෝ මණ්ඩලයක් ය.

(ii) සමුපකාර සමිති ප්‍රඥප්තියේ 51(2) වගන්තිය යටතේ විගණනයකට ඇතුළත් වන කාලය සෑම විටම කලින් පවත්වන ලද විගණනයට ඇතුළත් වූ කාලයේ අවසාන දිනය සිට එවර විගණනය පවත්වන දිනට පූර්වයෙන් අවසන් වූ මුදල් වර්ෂයේ අවසාන දින දක්වා හෝ රෙජිස්ට්‍රාර්තුමා විසින් වෙනත් විධානයක් කළහොත් එසේ විධානය කරන දින තෙක් හෝ විය යුතු ය.

(iii) අපරාධ නඩුවක් සඳහා යම් කිසි විගණනයක් අවශ්‍ය වූ විට දොළොස් මසකට අධික නොවන කාලයක් ඇතුළත් වන විශේෂ විගණනයක් සකස් කරන ලෙස ගණන් පරීක්ෂකවරයෙකුට අණ කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

(iv) ගණන් පරීක්ෂකවරයෙකු රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන ආකාරයට ගණන් පරීක්ෂණ වාර්තාවක් පිටපත් දෙකකින් යුක්තව රෙජිස්ට්‍රාර්තුමාට ඉදිරිපත් කළ යුතු ය. වෙනත් කරුණු අතරම පහත සඳහන් කරුණු පිළිබඳ ප්‍රකාශනයක් ඒ වාර්තාවට ඇතුළත් කළ යුතුය, එනම්,

(අ) තමාට අවශ්‍ය සියලුම තොරතුරු හා විස්තර ලබා ගත්තේ ද යන්න ;
(ආ) ගිණුම් පොත් සමිතිය විසින් කලට වේලාවට ලියා තිබේ ද යන්න ;
(ඇ) ශේෂ පත්‍රය හා ලාභ අලාභ ගිණුම සමිතියේ පොත්පත්වලට අනුකූලද යන්න.

(v) ගණන් පරීක්ෂක තැන රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරනු ලබන සියලුම උපලේඛන හා සහතික පත්‍ර තම ගණන් පරීක්ෂණ වාර්තාවට අමුණා එවිය යුතුය.

(vi) ගණන් පරීක්ෂක තැන පහත දැක්වෙන ආකෘතිය අනුව ගණන් පරීක්ෂණ සහතිකයක් සමිතියේ පරීක්ෂිත ශේෂ පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

මම/අපි සීමාසහිත/සීමාරහිත ................................................ සමුපකාර සමිතියේ / සංගමයේ ගිණුම් පරීක්ෂා කර බලා ඉහත පිටපත් කර තිබෙන ශේෂ පත්‍රයේ ගණන් පරීක්ෂා කළෙමි/කළෙමු. මම/අපි (මේ වාර්තාවේ ................ පිටුවේ සඳහන් ඒවා හැර) මට/අපට අවශ්‍ය වූ සියලුම විස්තර හා තොරතුරු සමිතියේ / සංගමයේ නිලධාරින්ගෙන් ලබා ගත්තෙමි/ගත්තෙමු. මම/අපි ශේෂ පත්‍රයේ සඳහන් සියලුම වත්කම් හා බැරකම් හරිවැරදි බැලුවෙමි/බැලුවෙමු. මේ වත්කම් බැරකම් තිබෙන බවටත්, ඒවායේ අගය වැඩිකර දක්වා නොමැති බවටත්, මම/අපි සෑහීමකට පත්වීමි/පත්වීමු. මට/අපට වැටහෙන පරිදි ද සමිතියේ / සංගමයේ පොත් වල දැක්වෙන්නා වූ හා මා වෙත/අප වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු හා විස්තර අනුවද ශේෂ පත්‍රය සමිතියේ / සංගමයේ කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා නියම තත්වය විදහාපාන පරිදි සකස් කර තිබෙන බව මාගේ / අපගේ අදහස වේ.

.................................... දිනය ............................................ ගණන් පරීක්ෂක තැන.

කැඳවීමට බලය

42. රෙජිස්ට්‍රාර්තුමාට හෝ සමුපකාර සමිති ප්‍රඥප්තියේ 51, 53 හා 54 වගන්ති යටතේ පිළිවෙලින් විගණනය, විභාගය, පරීක්ෂණය හෝ විමර්ශනය පැවැත්වීමට රෙජිස්ට්‍රාර්තුමාගෙන් බලය ලත් ඕනෑම කෙනෙකුට හෝ අවස්ථාවෝචිත පරිදි එවැනි විගණනයකට, විභාගයකට, පරීක්ෂණයකට හෝ විමර්ශනයකට අවශ්‍ය යැයි වැටහෙන ඕනෑම කෙනෙකු කැඳවීමට බලය ඇතිවේ. ඒ සඳහා සිතාසි අතින් දිය හැකිය. එසේ නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය හැකිය. එහෙත් එසේ කැඳවන ලද ඕනෑම කෙනෙකුට යටත් පිරිසෙයින් සම්පූර්ණ දින හතක් කල් දිය යුතුය.

සමුපකාර අරමුදල

43.

(i) සමුපකාර සමිති ප්‍රඥප්තියේ 46 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද සමුපකාර අරමුදල එකී ප්‍රඥප්තියේ 71 වගන්තිය පරිදි සකස් කරන ලද රීති අනුව ඇමතිතුමා විසින් පනවන ලද යම් කිසි සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව රෙජිස්ට්‍රාර්තුමා විසින් පරිපාලනය කළ යුතුය. ඒ අරමුදලෙහි මුදල් රෙජිස්ට්‍රාර්තුමා විසින් පහත සඳහන් කරුණු සඳහා යෙදිය හැකිය.

(අ) සමුපකාර අධ්‍යාපනය ව්‍යාප්තිය හා ප්‍රචාරක වැඩ ;

(ආ) සමුපකාර සමිතිවල කළමනාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම ;

(ඇ) සමුපකාර සමිතිවලට උපකාර කිරීම.

(ii) සෑම ලියාපදිංචි කළ සමිතියක්ම රෙජිස්ට්‍රාර්තුමා විසින් එසේ නියම කළ විට එතුමා විසින් නියම කරන පරිදි සමිතියේ වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට දහයකට වැඩි නොවන හා රුපියල් 100 කට අඩු නොවන මුදලක් සමුපකාර අරමුදලට දායක මුදල් වශයෙන් වර්ෂයක් පාසා ගෙවිය යුතුය.

අතිරික්ත අරමුදල

44.

(i) මින් ඉදිරියට අතිරික්ත අරමුදල යැයි කියනු ලබන අරමුදලක් ඌව පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 67(3) වගන්තියේ කටයුතු සඳහා රෙජිස්ට්‍රාර්තුමා විසින් පවත්වාගෙන යා යුතුය.

(ii) අතිරික්ත අරමුදලට බැරව තිබෙන මුදල් රෙජිස්ට්‍රාර්තුමා විසින් පහත සඳහන් කරුණු සඳහා යෙදිය හැකිය.

(අ) ඕනෑම ලියාපදිංචි කරන ලද ප්‍රාථමික සමිතියක කොටස් මිලයට ගැනීමෙන් හෝ රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කළ හැකි වෙනත් ආකාරයකට හෝ එවැනි සමිතියකට ආධාර කිරීමට ;

(ආ) අතිරික්තයක් ඇති වී තිබෙන දිස්ත්‍රික්කයේ පිහිටි ඕනෑම ලියාපදිංචි කරන ලද සමිතියකට යම් කිසි ස්ථාවර වත්කම් මිලයට ගැනීමට ආධාර කිරීමට ;

(ඇ) ඇවරකරුවෙකුට විරුද්ධව ඇති සිවිල් නඩුවකදී ඔහුගේ නිදහසට ක්‍රියා කිරීමට ඔහුට ආධාර කිරීමට,

(ඈ) සමුපකාර සමිති ප්‍රඥප්තියේ 6(1) (ඇ) හා (ඈ) වගන්තිය අනුව පිහිටුවන ලද ඕනෑම ලියාපදිංචි කළ සමිතියකට හෝ ලියාපදිංචි කළ සමිතිවලට ආධාර කිරීමේ කටයුත්ත සඳහා පිහිටුවන ලද වෙනත් ආයතනයකට හෝ ආධාර කිරීමට,

45. සමුපකාර සමිති ප්‍රඥප්තියේ 36(1) වගන්තියේ විධිවිධාන සඳහා ලියාපදිංචි කළ සමිතියක පොත්වල යම් කිසි සටහනක පිටපතක් ඒ පිටපත ඒ සටහනේ සත්‍ය පිටපතක් බවටත් ඒ සටහන ඇතුලත් පොත එවකටත් සමිතිය භාරයේ තිබෙන බවටත් ඒ පිටපතේ පහතින් ලියවිල්ලකින් ප්‍රකාශනයක් කර සහතික කළ හැකිය. එවැනි ප්‍රකාශනයක් සමිතියේ සභාපති හා කාරක සභාවේ වෙනත් සාමාජිකයෙකුද විසින් අත්සන් කර දිනය සඳහන් කර තිබිය යුතුය. සටහන්වල පිටපත්

46. ලියාපදිංචි කළ සමිතියක සංචිතය සමුපකාර සමිති ප්‍රඥප්තියේ 45 වගන්තිය අනුව ආයෝජනය කරන ලෙස රෙජිස්ට්‍රාර්තුමා විසින් විශේෂ නියෝගයකින් අණ කළ හොත් මිස එකී සමිතියේ කටයුතු සඳහා යෙදිය හැකිය. සංචිතය

47. සංචිතය නොබෙදිය හැකිය. එයින් යම් කිසි කොටසක් ඉල්ලීමට කිසිදු සාමාජිකයෙකුට බලයක් නොමැතිය.

48.

(i) ලියාපදිංචි කළ සමිතියකට වෙළඳ බඩු තොග හැර රුපියල් 50,000 ක් හෝ ඊට වැඩි වටිනාකමක් ඇති කිසිදු චංචල දේපලක් මහ සභාවේ අනුමැතිය හා රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබා නොගෙන අත් කර ගැනීම හෝ විකිණීම හෝ කළ නොහැකිය. සමිතියේ මුදල් වලින් ඉඩම් ආදිය අත්කර ගැනීම

(ii) ලියාපදිංචි කළ සමිතියක් විසින් මහ සභාවේ අනුමැතිය හා රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබාගෙන එහි පරමාර්ථ වලට සම්බන්ධ යම් කාර්යයක් සඳහා ඉඩම් ගොඩනැගිලි හෝ වෙනත් නිශ්චල දේපල මිලට ගැනීම තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අත් කර ගැනීම හා බද්දට ගැනීම හෝ විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම කළ හැකිය.

49.

(i) සමුපකාර සමිති ප්‍රඥප්තියේ 68 වන වගන්තිය යටතේ තීරණයක් සඳහා ආරවුලක් රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු කිරීමට තිබෙන විට, ආරවුල්

(අ) ලියාපදිංචි කළ සමිතියේ කාරක සභාව විසින්

හෝ

(ආ) ලියාපදිංචි කළ සමිතියේ මහ සභා රැස්වීමකදී සභා සම්මත වූ යෝජනාවක් අනුව ඒ ලියාපදිංචි කළ සමිතිය විසින්,

හෝ

(ඇ) ආරවුලට සම්බන්ධ එක පාර්ශවකරුවකු විසින්,

හෝ

(ඈ) ලියාපදිංචි කළ සමිතියේ කාරක සභිකයෙකුගෙන් හෝ වෙනත් නිලධාරියෙකුගෙන් හෝ අයවිය යුතු මුදලක් සම්බන්ධ ආරවුලක් නම් ලියාපදිංචි කළ සමිතියේ ඕනෑම සාමාජිකයෙකු විසින්,

හෝ

එය ඉදිරිපත් කළ හැකිය.

(ii) සමුපකාර සමිති ප්‍රඥප්තියේ 68(i) වෙනි වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු කළ හැකි ලියාපදිංචි කළ සමිතියක යම් කිසි ඉල්ලීමක් ඉහත 49(i) රීතිය යටතේ එසේ කළ හැකි යම් කිසිවකු විසින් රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු නොකළහොත් එවැනි ඉල්ලීමක් ඇති වන ඕනෑම ආරවුලක් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 51 වැනි වගන්තිය යටතේ ඒ සමිතියේ විගණනයක් හෝ 53 වැනි වගන්තිය යටතේ විභාගයක් හෝ 54 වන වගන්තිය යටතේ පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පවත්වා ඇති ඕනෑම කෙනෙකු විසින් එකී සමිතිය වෙනුවෙන් රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු කළ හැකිය.

(iii) ආරවුලක් සමථයකට පත් කිරීමට යා හැකි සම්පූර්ණ වියදම හෝ ඉන් කොටසක් හෝ පැමිණිලිකරු වශයෙන් ඉදිරිපත් වන තැනැත්තා විසින් කලින් ගෙවන ලෙස නියම කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

(iv) කාරක සභාවේ සාමාජිකයෙකු විසින් හෝ වෙනත් නිලධාරියෙකු විසින් හෝ ගෙවිය යුතු මුදලක් සම්බන්ධ ආරවුලක් තීරණය කිරීම සඳහා ලියාපදිංචි කළ සමිතියක ඕනෑම සාමාජිකයෙකු විසින් රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු කළ විට හෝ යම් කිසි ආරවුලක් 49(ii) රීතිය යටතේ ඕනෑම කෙනෙකු විසින් රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු කළ විට හෝ ඒ සාමාජිකයාට හෝ වෙනත් තැනැත්තාට ඒ ආරවුල පිළිබඳ සියලුම කටයුතුවලදී සමිතිය වෙනුවෙන් ක්‍රියා කිරීමටත් සමිතියේ ඒ ආරවුලට අදාල සියලුම පොත් පත් හා ලියකියවිලි බැලීමටත් බලය ඇති වේ. තවද ඒ සම්බන්ධයෙන් ඔහුට ඇති වන සාධාරණ වියදම් සමිතියෙන් අයකර ගැනීමට ඔහුට පුලුවන.

ආරවුලක යම් පාර්ශවකරුවෙකුට හෝ ආරවුලක පාර්ශවකරුවකු වෙනුවෙන් ක්‍රියා කරන කෙනෙකුට හෝ කිසියම් ආකාරයකින් අවහිර කරන කෙනෙක් වරදකට වරදකරුවෙක් වේ.

(v) (අ) යම්කිසි ආරවුලක් තීරණය කිරීම සඳහා බේරුම්කරුවකුට භාර කිරීමට රෙජිස්ට්‍රාර්තුමා තීරණය කළහොත් එවැනි බේරුම්කරුවකු රෙජිස්ට්‍රාර්තුමා විසින් පත් කළ යුතුය.

(ආ) ඉහත 49 (v) (අ) රීතිය යටතේ පත් කරන ලද බේරුම්කරුවෙකු මිය ගියහොත් හෝ බේරුම්කරුවකු වශයෙන් කටයුතු කිරීමට අකමැති වුවහොත් හෝ ඒ කටයුතු පැහැර හැරියොත් හෝ බේරුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා දැන ගතහොත් හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ අන් කරුණක් නිසා හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට ඔහුට නොහැකි වුවහොත් හෝ එසේ මිය ගියා වූ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට අකමැති වූ හෝ ක්‍රියා කිරීම පැහැර හැරියා වූ හෝ ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා විසින් දැන ගත්තා වූ හෝ පළාතේ නොසිටීම නිසා හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වූ හෝ ඒ තැනැත්තා වෙනුවට වෙනත් කෙනෙකු පත් කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

(ඇ) 49 (v) (අ) රීතිය යටතේ රෙජිස්ට්‍රාර්තුමා විසින් පත් කරන ලද බේරුම්කරුවෙකු බේරුම් කිරීම ගැන වහාම ක්‍රියා කර විභාගය සම්පූර්ණ කර තමා පත් වී තුන් මසක් ඇතුළත තීන්දුව දීම කළ යුතුය. එහෙත් එසේ පත් කරන ලද බේරුම්කරුවෙකුට ඒ කාලය ඇතුලත විභාගය සම්පූර්ණ කර තීන්දුව දීම කළ නොහැකි වේ නම් ඒ නියමිත තුන් මාසය ඇතුලත තීන්දුව දීමට නොහැකි හේතු දක්වමින් ඒ බව රෙජිස්ට්‍රාර්තුමාට වහාම දන්වා සිටිය යුතුය. තවද විභාග කර තීන්දුව දීම සම්පූර්ණ කිරීමට අවශ්‍ය යැයි තමාට වැටහෙන කාලය ද එහි දැක්විය යුතුය. එවිට ඒ කාලය තමාට වැටහෙන ප්‍රමාණයකින් දීර්ඝ කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට පුලුවන.

(ඈ) බේරුම්කරුවකුට ඉහත සඳහන් යම් කිසි කරුණක් නිසා ඒ බේරුම් කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කළ නොහැකි විට තමා වෙත යොමු කරන ලද ඒ සියලුම ලියකියවිලි රෙජිස්ට්‍රාර්තුමා වෙත වහාම ආපසු යැවිය යුතුය.

(ඉ) ආරවුලේ එක පාර්ශවකරුවෙකු නොපැමිණීම නිසා බේරුම්කරුවකු විසින් ඉල්ලීමක් නිශ්ප්‍රභා නොකළ යුතුවේ. යථා පරිදි කැඳවූ විටත් ආරවුලක විත්තිකරුවකු නොපැමිණියහොත් ඒ ආරවුල ඒකපාර්ශ්විකව තීරණය කර තීන්දුවක් දීමට බේරුම්කරු විසින් ක්‍රියා කළ යුතුය. එහෙත් ආරවුලක් පළමුවන දිනම ඒක පාර්ශ්විකව තීරණය නොකළ යුතුය.

(vi) යම්කිසි ආරවුලක් බේරුම්කරුවන් එක්කෙනෙකුට වැඩි ගණනකට භාර කිරීමට රෙජිස්ට්‍රාර්තුමා විසින් තීරණය කළහොත් බේරුම්කරුවන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් ඔහු විසින් පත් කළ යුතුය. ඒ මණ්ඩලයට ආරවුලේ එක් එක් පාර්ශවකරුවකු විසින් එක් එක්කෙනා බැගින් නම් කළ යුතු අතර, තුන්වන බේරුම්කරු රෙජිස්ට්‍රාර්තුමා විසින් නම් කළ යුතුය. රෙජිස්ට්‍රාර්තුමා විසින් නම් කළ අය මණ්ඩලයේ සභාපති වශයෙන් ක්‍රියාකළ යුතුය.

(vii) (අ) ආරවුලක යම් කිසි පාර්ශවකරුවකුට 49(vi) රීතිය යටතේ බේරුම්කරුවකු නම් කරන ලෙස රෙජිස්ට්‍රාර්තුමා විසින් දන්වා සිටිය විට දින 15 ක් ඇතුළත එසේ නොකලහොත් ඒ වෙනුවට කෙනෙකු නම් කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට පුලුවන.

(ආ) ආරවුලක යම් පාර්ශවකරුවකු විසින් නම් කරන ලද බේරුම්කරුවකු මිය ගිය හොත් හෝ බේරුම්කරුවකු වශයෙන් කටයුතු කිරීමට අකමැති වුවහොත් හෝ ඒ කටයුතු පැහැර හැරියොත් හෝ බේරුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා දැන ගතහොත් හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ අන් කරුණක් නිසා හෝ බේරුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීමට ඔහුට නොහැකි වුවහොත් හෝ එසේ මිය ගියාවූ හෝ බේරුම්කරුවකු වශයෙන් ක්‍රියාකිරීමට අකමැති වූ හෝ ක්‍රියා කිරීම පැහැර හැරියා වූ ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා විසින් දැනගත්තා වූ හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ වෙනත් කරුණක් නිසා හෝ බේරුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වූ හෝ ඒ තැනැත්තා වෙනුවට වෙනත් බේරුම්කරුවකු නම් කරන ලෙස ඒ පාර්ශවකරුට දන්වා සිටීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය ඇතිවේ. ඒ පාර්ශවකරු දින 15 ක් ඇතුළත එසේ නොකළහොත් රෙජිස්ට්‍රාර්තුමා විසින් බේරුම්කරුවකු නම් කළ හැකිය.

(ඇ) රෙජිස්ට්‍රාර්තුමා විසින් බේරුම්කරුවකු වශයෙන් නම් කරන ලද කෙනෙකු මිය ගිය හොත් හෝ බේරුම්කරුවකු වශයෙන් කටයුතු කිරීමට අකමැති වුවහොත් හෝ ඒ කටයුතු පැහැර හැරියොත් හෝ බේරුම්කරුවකු වශයෙන් ක්‍රියාකිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා දැන ගතහොත් හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ අන් කරුණක් නිසා හෝ බේරුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීමට ඔහුට නොහැකි වුවහොත් හෝ එසේ මිය ගියාවූ හෝ බේරුම්කරුවකු වශයෙන් ක්‍රියාකිරීමට අකමැති වූ හෝ ක්‍රියාකිරීම පැහැර හැරියා වූ හෝ ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා විසින් දැනගත්තා වූ හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ වෙනත් කරුණක් නිසා හෝ බේරුම්කරුවකු වශයෙන් ක්‍රියාකිරීමට අපොහොසත් වූ හෝ ඒ තැනැත්තා වෙනුවට වෙනත් කෙනෙකු නම් කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

(viii) ආරවුලක කිසිම පාර්ශවකරුවකු නීතිඥයකු බේරුම්කරුවකු වශයෙන් නම් කළ නොහැකිය.

(ix) මේ රීතිය යටතේ සියලුම ක්‍රියාවලදී රෙජිස්ට්‍රාර්තුමාට හෝ බේරුම්කරුට හෝ බේරුම්කරුවන්ට හෝ පහත සඳහන් බලතල ඇතිවේ :

(අ) දිවුරවීම

(ආ) වාචිකව හෝ අතින් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ සමිතියේ කටයුතු කරන ප්‍රදේශය කෙරෙහි අධිකරණ බලය ඇති ළඟම තිබෙන සිවිල් උසාවිය මගින් හෝ සිතාසි යවා ආරවුලේ පාර්ශවකරුවන් හා සාක්ෂිකරුවන් කැඳවීම හා අවශ්‍ය සියලුම පොත් පත් හා ලියකියවිලි ඉදිරිපත් කරවීම.

(ඇ) 49(i) (ඈ) හෝ 49 (ii) රීතිය යටතේ තීරණය කිරීම සඳහා ආරවුලක් යොමු කරන පාර්ශවකරුගේ හෝ තැනැත්තාගේ හෝ වියදම් ඇතුලුව ආරවුල තීරණය කිරීමට ගිය වියදම් සමිතියේ මුදල් වලින් හෝ සුදුසු යයි තමාට වැටහෙන යම් කිසි පාර්ශවකරුවකු හෝ පාර්ශවකරුවන් විසින් ගෙවන ලෙස නියෝග කිරීම.

(x) රෙජිස්ට්‍රාර්තුමා හෝ බේරුම්කරු හෝ බේරුම්කරුවන් හෝ ආරවුලට සම්බන්ධ පාර්ශවකරුවන්ගේද ඔවුන්ගේ සාක්ෂිකරුවන්ගේද සාක්ෂි අසා ඒ අනුව ද කිසිම පාර්ශවකරුවකු විසින් ලියකියවිලි වලින් ඉදිරිපත් කරන සාක්ෂි වෙතොත් ඒවාද සැලකිල්ලට ගෙන, අවස්ථාවෝචිත පරිදි තීරණය හෝ තීන්දුව හෝ යුක්තිය සාධාරණත්වය හා හෘද සාක්ෂිය අනුව දිය යුතුය.

බේරුම්කරුගේ හෝ බේරුම්කරුවන්ගේ හෝ තීන්දුව ලියා පාර්ශවකරුවන්ට කියවා රෙජිස්ට්‍රාර්තුමා හෝ එතුමා විසින් නියම කළ හැකි එතුමා යටතේ ක්‍රියා කරන නිලධාරියෙකුගේ හෝ කාර්යාලයට විභාග වාර්තාවක් සමග යැවිය යුතුය.

(xi) බේරුම්කරුවන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් වෙත ඉදිරිපත් වන කරුණක් තීරණය කළ යුත්තේ වැඩි දෙනාගේ අදහස අනුවය. එක එක බේරුම්කරුගේ අදහස් වෙනස් වූ විට මණ්ඩලයේ සභාපති තැනගේ අදහස පරිදි තීරණය කළ යුතුය.

(xii) (අ) බේරුම්කරුවකුගේ හෝ බේරුම්කරුවන්ගේ තීන්දුවකට විරුද්ධව රෙජිස්ට්‍රාර්තුමාට කරන ඕනෑම ආයාචනයක් ඊට හේතු ලියවිල්ලකින් දක්වමින් තීන්දුව දෙන ලද දින සිට දින තිහක් ඇතුලත කළ යුතුය. තවද තීන්දුව දෙන ලද්දේ යම් කිසි පාර්ශවකරුවකුට විරුද්ධවද, ඒ පාර්ශවකරු විසින් අභියාචනයක් කරන කළ සමුපකාර සමිති ප්‍රඥප්තියේ 68(3) වගන්තිය පරිදි අදාල තැන්පතු මුදලක් ආයාචනය සමග යැවිය යුතුය.

(ආ) ඉහත සඳහන් කරුණුවලට අනුකූලව නොකරන ආයාචනයක් රෙජිස්ට්‍රාර්තුමා විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.

(ඇ) ආරවුලට සම්බන්ධ කිසිම පාර්ශවකරුවකුගෙන් කරුණු නොඅසා ආයාචනයක් තීරණය කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

(ඈ) ආයාචනයක් ඉදිරිපත් කිරීමට සාධාරණ කරුණු තිබේ යැයි රෙජිස්ට්‍රාර්තුමා විසින් සෑහීමකට පත්වූ විට ආයාචනය ඉදිරිපත් කරන තැනැත්තා විසින් තැන්පත් කරන ලද මුදල ඔහුට ආපසු දිය හැකිය.

(ඉ) ආයාචනයක් ඉදිරිපත් කිරීමට සාධාරණ කරුණු නොමැති යැයි රෙජිස්ට්‍රාර්තුමා සෑහීමකට පත්වූ විට ආයාචනය සඳහා කරන ලද තැන්පත් මුදල පළාත් සභා අරමුදලට බැර කළ හැකිය.

(xiii) රෙජිස්ට්‍රාර්තුමා හෝ බේරුම්කරුවකු හෝ බේරුම්කරුවන් හෝ ඉදිරියේදී කිසිම පාර්ශවකරුවකු වෙනුවෙන් නීතිඥයෙකුට පෙනී සිටීමට නුපුළුවන.

ලේකම්වරයා වෙත කරන ආයාචනා

50. සමුපකාර සමිති ප්‍රඥප්තියේ 51 වැනි වගන්තිය යටතේ කරන ආයාචනයක් සම්බන්ධයෙන් පළාත් අමාත්‍යාංශ ලේකම් වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

ඇමතිතුමාට කරන ආයාචනා

51. සමුපකාර සමිති ප්‍රඥප්තියේ 59 වැනි වගන්තිය යටතේ කරන ආයාචනයක් සම්බන්ධයෙන් ඇමතිතුමාගේ තීරණය අවසාන තීරණය වේ.

52. සමුපකාර සමිති ප්‍රඥප්තියේ 56 වන වගන්තිය යටතේ යම් කිසිවකු හෝ යම්කිසි අය හෝ ලියාපදිංචි කරන ලද සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා පත්කළ විට විසුරුවා හරින ලද කාරක සභාවේ සභිකයින් ඒ තැනැත්තාට හෝ ඒ අයට හෝ සමිතියේ සම්පූර්ණ ව්‍යාපාරික කටයුතු ද සමිතියේ පොත් පත් හා ලියකියවිලි ඇතුළු වෙනත් සියලුම දේපල ද රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කළ හැකි කාලයක් ඇතුලත භාර දිය යුතුය. කාරක සභාව විසින් සමිතිය සම්පූර්ණ ව්‍යාපාරික කටයුතු ද පොත් පත් හා ලියකියවිලි ඇතුලු වෙනත් සියලුම දේපලද රෙජිස්ට්‍රාර්තුමා විසින් පත් කරන ලද තැනැත්තාට හෝ අයට හෝ භාර නොදුනහොත් ඒ එක එක කාරක සභිකයා වරදකට වරදකරුවෙක් වේ.

සාමාජිකයින් නොවන අය සමග ගණු දෙනු

53. ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකයන් නොවන්නන් සමග කරන යම් කිසි ගණුදෙනු සමුපකාර ප්‍රතිපත්තිවලට පටහැනි යැයි හෝ එවැන්නකින් ලියාපදිංචි කළ සමිතිවලට හිමිවන වරප්‍රසාදයක් අනිසි ලෙස යෙදවීමක් හෝ ආදායම් බදු ගෙවීම මගහැරීමක් හෝ රජයේ හෝ පළාත් සභාවේ යම් කිසි නියෝග හෝ රීති හෝ කඩකිරීමක් හෝ සිදුවේ යැයි රෙජිස්ට්‍රාර්තුමාට වැටහුනහොත් එවැනි ගණුදෙනු තහනම් කිරීමට හෝ සීමා කිරීමට හෝ රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

වැරදි

54. මේ රීතිය යටතේ කෙරෙන ඕනෑම වරදක් සම්බන්ධයෙන් සමුපකාර සමිති ප්‍රඥප්තියේ විශේෂයෙන් සඳහන් කර නොමැති නම්, එම ප්‍රඥප්තියේ 82 වගන්තිය යටතේ කෙරෙන වැරදි හා සමානව ක්‍රියාකළ යුතුය.

අර්ථ දැක්වීම

55. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම රීතිවල ''ප්‍රඥප්තිය'' යන්නෙන් 2011 අංක 3 දරන ඌව පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය ද,

''රෙජිස්ට්‍රාර්වරයා'' හෝ ''රෙජිස්ට්‍රාර්තුමා'' ලෙස ඌව පළාත් සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ යුතුකම් ඉටුකිරීම සඳහා ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද අයෙකුද,

ලියාපදිංචි කළ ''සමිතිය'' යන සියළු තැන්හිදී ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් යන්න ද අදහස් වේ.

56. මෙම රීති මාලාවේ සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. සිංහල භාෂා පාඨය බල පැවැත්වෙන බව

## උපලේඛනය

ලියාපදිංචි අංකය :

ලියාපදිංචි කිරීමේ සහතික පත්‍රයේ ආකෘතිය
(4 වැනි රීතිය)

.................................................................. සමිතිය

........................................................ යන ලිපිනය.

හා ඉහත සඳහන් නාමය දරන ........................................................

..................................................................... වගකීමක් ඇති සමුපකාර සමිතියක් ලෙස 2011 අංක 3 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 8(1) වන වගන්තිය යටතේ අද දින ලියාපදිංචි කළ බව මෙයින් සහතික කරමි.

..............................................................................
(ඌව පළාත් සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.)

දිනය : ....................................

10-183

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.